# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 26 දරන
# අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 ඔක්තෝබර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1997 ඔක්තෝබර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

## 1997 අංක 26 දරන අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1997 ඔක්තෝබර් මස 17 වැනි දින]

එල්. ඩී.-ඕ. 51/96.

ගිවිසුම් කඩ කිරීම හෝ නොසැලකිලිමත්කම හෝ වෙනත් යුතුකම් කඩ කිරීම සඳහා වූ සිවිල් වගකීම ගිවිසුම් නියම මගින් හෝ අන්‍යාකාරයකින් මගහැරිය හැකි ප්‍රමාණය මත සීමා පැනවීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1997 අංක 26 දරන අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) 3, 4 සහ 5 වන වගන්තිවල ඇතුළත් කිසිවක් මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් ගිවිසුමකට හෝ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. අදාළ වීම.

(2) 3, 4, 5 සහ 6 වන වගන්තිවල විධිවිධාන ව්‍යාපාරික වගකීමට පමණක් අදාළ විය යුතු අතර, වගකීම් සම්බන්ධයෙන් ඒ වගන්තිවල සඳහන් කර ඇති සඳහන් කිරීම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

3. (1) නොසැලකිලිමත්කමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන මරණය හෝ පුද්ගලයන්ට සිදු කරන තුවාල සඳහා තැනැත්තකුගේ වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කරන හෝ බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති ගිවිසුම් නියමයක් හෝ තැනැත්තන්ට පොදුවේ හෝ නිශ්චිත තැනැත්තන්ට හෝ දෙන ලද දැන්වීමක් බලපෑම් රහිත විය යුතු ය. නොසැලකිලිමත්කම සඳහා වගකීම මග හැරීම.

(2) නොසැලකිලිමත්කමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන වෙනත් යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා තැනැත්තකුගේ වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කරන හෝ බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති ගිවිසුම් නියමයක් හෝ තැනැත්තන්ට පොදුවේ හෝ නිශ්චිත තැනැත්තන්ට දෙන ලද දැන්වීමක්, ඒ ගිවිසුම් නියමය හෝ දැන්වීම යුක්තිසහගත භාවය පැවතීමේ අවශ්‍යතාව සපුරාලනතාක් දුරට පමණක් බලපෑම් සහිත විය යුතු ය.

2—D 045645—5,900 (97/07)

(3) ගිවිසුම් නියමයකින් හෝ දැන්වීමකින් හෝ නොසැලකිලිමත්කම සඳහා වගකීම බැහැර කෙරෙන බව හෝ සීමා කෙරෙන බව අදහස් වන නැතහොත් ඒ වගකීම බැහැර කිරීම සීමා කිරීමේ බලපෑම ඇති අවස්ථාවක, ඒ ගිවිසුම් නියමයට තැනැත්තකු එකඟවීම හෝ ඒ දැන්වීම පිළිබඳව දැන සිටීම ඒ නයින්ම ඔහු යම් අවදානමක් භාර ගැනීම සංයුක්ත වන ලෙස තේරුම් ගනු නොලැබිය යුතු ය.

ගිවිසුම් සඳහා වගකීම මග හැරීම.

4. (1) මේ වගන්තිය ගිවිසුමක එක් පාර්ශ්වයක් පාරිභෝගිකයකු වශයෙන් හෝ අනෙක් පාර්ශ්වයේ ලිඛිත සම්මත ව්‍යාපාර නියම මත හෝ කටයුතු කරන අවස්ථාවක ගිවිසුමේ පාර්ශ්වකරුවන් අතර අදාළ වන්නේ ය.

(2) ගිවිසුම් නියමය යුක්තිසහගත භාවය පැවතීමේ අවශ්‍යතාව සපුරාලන (මේ උපවගන්තියේ පහත සඳහන් අවස්ථා අතරින් යම් අවස්ථාවක දී) යම් තාක් දුරට හැර, පාරිභෝගිකයකු වශයෙන් හෝ ලිඛිත සම්මත ව්‍යාපාර නියම මත කටයුතු කරන පාර්ශ්වකරු සම්බන්ධයෙන් වන විට යම් ගිවිසුම් නියමයකට යොමු කිරීමෙන් අනෙක් පාර්ශ්වකරු විසින්—

(අ) ගිවිසුම කඩ කරන තැනැත්තා ඔහු ම වන විට ඒ කඩ කිරීම සම්බන්ධයෙන් ඔහුගේ යම් වගකීමක් බැහැර කිරීම හෝ සීමා කිරීම කළ නොහැකි ය : හෝ

(ආ) (i) ගිවිසුම යටතේ ඔහුගෙන් යුක්තිසහගත ලෙස අපේක්ෂිත ගිවිසුම්ගත ඉටු කිරීම්වලට සාරානුකූලව වෙනස් ගිවිසුම්ගත ඉටු කිරීම්වලට : හෝ

(ii) ඔහුගේ සම්පූර්ණ ගිවිසුම්ගත බැඳීම හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් කිසිම ඉටු කිරීමක් නොකර සිටීමට

තමා හිමිකම් ලබන්නේ යයි කියා සිටිය නොහැකි ය.

අසාධාරණ වගකීමෙන් නිදහස් කිරීමේ වගන්ති.

5. (1) පාරිභෝගිකයකු වශයෙන් කටයුතු කරන තැනැත්තකු වෙත, වෙනත් යම් තැනැත්තකු නොසැලකිලිමත්කම හෝ ගිවිසුම් කඩ කිරීම සඳහා ඒ වෙනත් තැනැත්තාට දරන්නට සිදු වූ වගකීමක් සම්බන්ධයෙන් (ඒ වෙනත් තැනැත්තා ගිවිසුමට පාර්ශ්වකරුවකු වුව ද නොවුව ද) වගකීමෙන් නිදහස් කිරීම සඳහා වූ බැඳීමක් නියම කෙරෙන බව අදහස් කෙරෙන ගිවිසුම් නියමයක් එම ගිවිසුම් නියමය යුක්තිසහගත භාවය තිබීමේ අවශ්‍යතාව සපුරාලනතාක් දුරට පමණක් බලපෑම සහිත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වගකීම—

(අ) වගකීමෙන් නිදහස් කිරීමට පිටින තැනැත්තාගේ සෘජු වගකීමක් වුව ද නැතහොත් ඔහුට ප්‍රතිප්‍රරූප වශයෙන් දැරීමට ඇති වගකීමක් වුව ද;

(ආ) පාරිභෝගිකයා වශයෙන් කටයුතු කරන තැනැත්තා වෙත නැතහොත් වෙනත් යම් තැනැත්තකු වෙත ඇති වගකීමක් වුව ද

මේ වගන්තිය අදාළ වන්නේ ය.

නිදර්ශනය—

"බී" ගේ මෝටර් රථය පාරුවෙන් ප්‍රවාහනය කිරීමට පාරු හිමියෙක් වන "ඒ", "බී" සමග ගිවිසුමකට එළඹෙයි.

ගිවිසුමේ එක් නියමයක් වන්නේ 'බී' විසින් 'ඒ' ගේ කාර්ය මණ්ඩලය විසින් මෝටර් රථය නොසැලකිලිමත් ලෙස එහා මෙහා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තුන්වන පාර්ශ්වකරුවන්ට සිදුවන අලාභවලට එරෙහිව 'බී' විසින් 'ඒ' හානිපූරණය කළ යුතු බව ය.

නියමය වලංගුවන්නේ ඉන් යුක්තිසහගත භාවයේ සාධාරණ පරීක්ෂණය ඉටුවන්නේ නම් පමණකි.

6. (1) සාමාන්‍යයෙන් පෞද්ගලික ප්‍රයෝජනය හෝ පරිභෝජනය සඳහා වූ වර්ගයක බඩු සම්බන්ධයෙන් වන විට— ඇපවී

(අ) පාරිභෝගිකයා විසින් ප්‍රයෝජනයට ගැනීමේ දී දෝෂ සහිත බව ඔප්පුවන බඩුවලින් ඇතිවන; සහ

(ආ) බඩු නිෂ්පාදනයට හෝ බෙදා හැරීමට සම්බන්ධ තැනැත්තකුගේ නොසැලකිලිමත්කම නිසා ඇතිවන

යම් අලාභයක් හෝ පාඩුවක් සඳහා වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කෙරෙන හෝ බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති භාණ්ඩ සම්බන්ධයෙන් වූ ඇපවීමක අඩංගු හෝ එවැනි ඇපවීමකට යොමු කිරීම මගින් ක්‍රියාත්මක කෙරෙන ගිවිසුම් නියමයක් හෝ දැන්වීමක් බලපෑම් රහිත විය යුතු ය.

(2) මේ වගන්තියේ—

"පාරිභෝගික ප්‍රයෝජනය" යන්න භාණ්ඩ සම්බන්ධයෙන් යෙදෙන විට, තනිකරම ව්‍යාපාර කාර්ය සඳහා හැර ප්‍රයෝජනය හෝ ප්‍රයෝජනය සඳහා සන්තකය දැරීම ඉන් අදහස් වේ ;

"ඇපවීම" යන්නෙන්, කවර හෝ ආකාරයකින් වචන භාවිත කර තිබුණ ද, සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ප්‍රතියෝජනය කිරීමෙන් හෝ අලුත්වැඩියා කිරීමෙන් හෝ මුදලින් වන්දි ගෙවීමෙන් හෝ අන්‍යාකාරයකින් දෝෂ නිවැරදි කරන බවට වූ යම් පොරොන්දුවක් හෝ සහතිකවීමක් ඇතුළත් හෝ ඇතුළත් යයි කියනු ලබන ලියවිල්ලක් අදහස් වේ.

කිණීම සහ ...ලී ...න්තක්කරය.

7. (1) (අ) භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 13 වන වගන්තියෙන් :

(ආ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 4(1) වන වගන්තියෙන්

උද්ගත වන බැඳීම් කඩ කිරීම සඳහා වූ වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කෙරෙන හෝ ඒ වගකීම බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති ගිවිසුම් නියමයක් බලපෑම් රහිත විය යුතු ය.

(2) (අ) භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 14, 15 හෝ 16 වන වගන්තිවලින් :

(ආ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 4(2), 4(3), 4(4) හෝ 4(5) වගන්තිවලින්

උද්ගත වන බැඳීම් කඩ කිරීම සඳහා වූ වගකීම, පාරිභෝගිකයකු වශයෙන් කටයුතු කරන තැනැත්තකු සම්බන්ධයෙන් වන්නා වූ වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කෙරෙන හෝ ඒ වගකීම බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති ගිවිසුම් නියමයක් බලපෑම් රහිත විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධානවල යමකින් ඇති වන බැඳීම් කඩ කිරීම සඳහා වූ වගකීම, පාරිභෝගිකයකු වශයෙන් නොව අන්‍යාකාරයකින් කටයුතු කරන තැනැත්තකු සම්බන්ධයෙන්, බැහැර කිරීමට හෝ සීමා කිරීම අදහස් කෙරෙන හෝ එම වගකීම බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති ගිවිසුම් නියමයක්, එය යුක්තිසහගත භාවය තිබීමේ අවශ්‍යතාව සපුරාලනතාක් දුරට පමණක් බලපෑම් සහිත විය යුතු ය.

8. (1) මේ පනතේ විධිවිධාන යටතේ ගිවිසුම් නියමයක්, එය යුක්තිසහගත භාවය පැවතීමේ අවශ්‍යතාව සපුරාලන්නේ නම් පමණක් බලසහිත වන අවස්ථාවක, ඒ නියමය කඩ කිරීම නිසා හෝ එය ප්‍රතික්ෂේප කළ ලෙස සැලකීමට පාර්ශ්වයක් විසින් තෝරා ගැනීමෙන් ගිවිසුම අවසාන කරනු ලැබ ඇති වුව ද, එය එම යුක්ති සහගත භාවය පැවතීමේ අවශ්‍යතාව සපුරාලන බව තීරණය කොට එය බලසහිත කරනු ලැබිය හැකි ය.

කඩකිරීමේ බලපෑම.

(2) ගිවිසුමක්, එය ප්‍රතික්ෂේප කළ ලෙස සැලකීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් ස්ථිර කර ඇති අවස්ථාවක, ඒ ස්ථිර කිරීම, යම් ගිවිසුම් නියමයක් සම්බන්ධයෙන් යුක්තිසහගත භාවය පැවතීමේ අවශ්‍යතාව බැහැර කරන්නක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

9. මේ පනතේ විධිවිධාන මගින් බැහැර කිරීමෙන් හෝ සීමා කිරීමෙන් වෙනත් යම් තැනැත්තකු විෂයයෙහි තහනම් වන ඒ වෙනත් යම් තැනැත්තාගේ වගකීම ක්‍රියාත්මක කිරීමෙහි ලා අදාළ අයිතිවාසිකම් වන්නා වූ, යම් තැනැත්තකු පාර්ශ්වකරුවකු වන වෙනත් ගිවිසුමක් යටතේ හෝ වෙනත් ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උද්ගත වන්නා වූ ඒ ගිවිසුමේ ඒ පසුව සඳහන් කළ තැනැත්තාගේ අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නේ යයි නැතහොත් ඒ අයිතිවාසිකම් ඉවත් කරන්නේ යයි අදහස් කරනු ලබන ගිවිසුම් නියමයක්, බල සහිත නොවිය යුතු ය.

ද්විතීය ගිවිසුම් අනුසාරයෙන් මග හැරීම.

10. (1) යුක්තිසහගත භාවයේ අවශ්‍යතාව සපුරාලනතාක් දුරට පමණක් මේ පනත යටතේ බලාත්මක වන ගිවිසුම් නියමයක් ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී පාර්ශ්වකරුවන් දැන සිටි හෝ සාධාරණව දැන සිටිය යුතු හෝ ඔවුන් විසින් අදහස් කර තිබූ අවස්ථාගත කරුණුවලට සැලකිල්ල යොමුකළ කල ගිවිසුමට ඇතුළත් කිරීමට සාධාරණ සහ යුක්තිසහගත නියමයක් වේ නම් එම අවශ්‍යතාව සපුරාලයි.

යුක්ති සහගත භාවය.

(2) 7 වන වගන්තියේ කාර්ය සඳහා ගිවිසුම් නියමයක් සාධාරණත්වයේ අවශ්‍යතාව සපුරාලන්නේ ද යන වග තීරණය කිරීමේ දී (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති කරුණු ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. මේ උපවගන්තියේ කිසිවක්, යම් අදාළ වගකීමක් බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කෙරෙන නියමයක් එම ගිවිසුමේ නියමයක් නොවන බව, යම් නීතියේ රීතියකට අනුකූලව තීරණය කිරීමෙන් අධිකරණයක් හෝ බේරුම්කරුවකු වළක්වන්නක් ලෙස කියවීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

(3) යුක්තිසහගත භාවයේ අවශ්‍යතාව සපුරාලනතාක් දුරට පමණක් මේ පනත යටතේ බලාත්මක වන (ගිවිසුම් බලපෑමක් ඇති දැන්වීමක් නොවන) දැන්වීමක්, වගකීම ඇති වූ විට හෝ ඇතිවන්නට තිබූ විට පැවති සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන ඒ මත විශ්වාසය තැබීමට ඉඩදීම සාධාරණ සහ යුක්ති සහගත වන්නේ නම් ඒ අවශ්‍යතාව සපුරාලීමක් වන්නේ ය

(4) ගිවිසුම් නියමයකට හෝ දැන්වීමකට යොමු කිරීමෙන් තැනැත්තකු ඔහුගේ වගකීම නිශ්චිත මුදල් ප්‍රමාණයකට සීමා කිරීමට අදහස් කරන්නා වූ ද ඒ නියමය හෝ දැන්වීම යුක්ති සහගත භාවය පැවතීමේ අවශ්‍යතාව ඉටු කරන්නේ ද යන ප්‍රශ්නය පැන නැගෙන්නා වූ ද අවස්ථාවක—

(අ) වගකීම ඇතිවුවහොත් එය ඉටු කිරීමේ කාර්යය සඳහා ඒ තැනැත්තාට ලබාගත හැකි යයි බලාපොරොත්තු විය හැකි සම්පත්; සහ

(ආ) ඒ තැනැත්තා රක්ෂණයෙන් ආවරණය ලබා ගැනීමට කොතරම් දුරට ඉඩ තිබුණේ ද

යන කාරණා පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතු ය.

(5) ගිවිසුම් නියමයක් හෝ දැන්වීමක් යුක්තිසහගත භාවයේ අවශ්‍යතාව සපුරන බව පෙන්වීම, එය එසේ බව කියා සිටින පාර්ශ්වකරුගේ යුතුකම වන්නේ ය.

නිදහස් කිරීමේ වගන්තිවල ප්‍රමාණය.

11. මේ පනතේ විධිවිධාන මගින් යම් වගකීමක් බැහැර කිරීම හෝ සීමා කිරීම තහනම් කරනතාක් ප්‍රමාණයට ම—

(අ) වගකීම ඇති කිරීම හෝ සීමා කිරීමේ හෝ භාරදූර කොන්දේසිවලට යටත්ව ඒ වගකීම ක්‍රියාත්මක කිරීම;

(ආ) වගකීම සම්බන්ධයෙන් අයිතිවාසිකම් කිසිවක් හෝ ප්‍රතිකර්මයක් බැහැර කිරීම හෝ සීමා කිරීම හෝ යම් තැනැත්තකු එවැනි යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිකර්මයක් අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ තැනැත්තා යම් අගතියකට යටත් කිරීම;

(ඇ) සාක්ෂි හෝ කාර්ය පටිපාටිය පිළිබඳ රීති බැහැර කිරීම හෝ සීමා කිරීම

තහනම් වන අතර, ඒ ප්‍රමාණයට අදාළ බැඳීම හෝ යුතුකම බැහැර කිරීමට අදහස් කරන නියමවලට සහ කොන්දේසිවලට යොමු කිරීමෙන් 3, 6 සහ 7 වන වගන්තිවලින් වගකීම බැහැර කිරීම හෝ සීමා කිරීම ද තහනම් වන්නේ ය:

එසේ වුව ද අනාගතයේ දී ඇතිවන මතභේද බේරුම් කිරීම පිණිස ඉදිරිපත් කිරීම සඳහා වූ ලියවිල්ලකින් වූ ගිවිසුමක්, මේ පනතේ කාර්ය සඳහා එවැනි යම් වගකීමක් බැහැර කරන හෝ සීමා කරන සේ සලකනු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

13. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ව්‍යාපාරය" යන්නට වෘත්තියක් ද, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක ක්‍රියාකාරකම් ද, ඇතුළත් වේ.

"ව්‍යාපාරික වගකීම" යන්නෙන්—

(අ) (තමාගේ ව්‍යාපාරයක් හෝ වෙනත් තැනැත්තකුගේ ව්‍යාපාරයක් වුව ද) ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අතරතුර දී තැනැත්තකු විසින් කරන ලද හෝ කිරීමට ඇති දේවලින්;

(ආ) පදිංචිකරුගේ ව්‍යාපාර කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක පදිංචියෙන්

උද්ගත වන බැඳීම් හෝ යුතුකම් කඩ කිරීම සඳහා වූ වගකීම අදහස් වේ.

"භාණ්ඩ" යන්නට, භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ම ඇත.

"කුලී සින්නක්කර ගිවිසුම" යන්නට, 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය.

"නොසැලකිලිමත්කම" යන්නෙන්—

(අ) ගිවිසුමක ප්‍රකාශිත හෝ ව්‍යංජිත නියමයන්ගෙන් ගිවිසුම ඉටු කිරීමේ දී යුක්තිසහගත සැලකිල්ලක් දැක්වීමට හෝ යුක්තිසහගත දක්ෂතාවකින් කටයුතු කිරීමට ඇතිවන යම් බැඳීමක් ;

(ආ) සාධාරණ සැලකිල්ලක් දැක්වීමට හෝ සාධාරණ දක්ෂතාවකින් කටයුතු කිරීමට ඇතිවන පොදු නීතියේ කිසියම් යුතුකමක්

කඩ කිරීම අදහස් වේ.

"දැන්වීම" යන්නට ලියවිල්ලකින් වුව ද නොවුව ද නිවේදනයක් සහ වෙනත් යම් සන්නිවේදනයක් අදහස් වේ.

"පුද්ගලයකුට සිදු කරන තුවාල" යන්නෙන් යම් අසනීපයක් සහ තැනැත්තකුගේ ශාරීරික හෝ මානසික තත්ත්වයට බාධාවීම ඇතුළත් වෙයි.

(2) ගිවිසුමක පාර්ශ්වකරුවකු—

(අ) ඔහු ව්‍යාපාරයක ක්‍රියාවලිය ඇතුළත ගිවිසුමට එළඹෙන්නේ නැත්නම් හෝ එසේ කරන බව පෙන්වා සිටින්නේ නැත්නම්: සහ

(ආ) අනෙක් පාර්ශ්වය විසින් ව්‍යාපාරයක ක්‍රියාවලිය ඇතුළත ගිවිසුමට එළඹෙන්නේ නම්: සහ

(ඇ) භාණ්ඩ විකිණීම හෝ කුලී සින්නක්කර නීතියෙන් පාලනය වන ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට කොන්ත්‍රාත්තුව යටතේ හෝ ඒ අනුව මාරුවන බඩු සාමාන්‍යයෙන් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා හෝ පරිභෝජනය සඳහා සපයන වර්ගයේ බඩු වන්නේ නම්

වෙනත් පාර්ශ්වයක් සම්බන්ධයෙන් "පාරිභෝගිකයකු" වශයෙන් කටයුතු කරන්නේ වෙයි.

(3) වෙන්දේසියේ හෝ තරඟකාරී ටෙන්ඩර් මගින් විකිණීමක දී ගැනුම්කරු කවර අවස්ථාගත කරුණු යටතේවත් පාරිභෝගිකයකු වශයෙන් ගණුදෙනු කරන ලෙස නොසැලකිය යුතු ය.

(4) ඉහත සඳහන් කරුණුවලට යටත්ව තමා පාරිභෝගිකයකු වශයෙන් ගණුදෙනු නොකරන බව පෙන්නුම් කිරීම, එසේ නොකරන බව කියා සිටින තැනැත්තාට භාර වේ.

පළමුවන උපලේඛනය [2 (1) වන වගන්තිය]

යම් රක්ෂණ ගිවිසුමක—

යම් ගිවිසුමක් ඉඩමක සම්බන්ධතාවක් ඇති කිරීමට හෝ පැවරීමට හෝ එවැනි යම් සම්බන්ධතාවක් අවසාන කිරීමට අදාළ වන තාක් දුරට, එම ගිවිසුම

යම් ගිවිසුමක් යම් පේටන්ට් බලපත්‍රයක, වෙළෙඳ ලකුණක, කාර්මික සැලසුමක් හෝ වෙනත් බුද්ධිමය දේපළක්, අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ඇති කිරීමට හෝ පැවරීමට හෝ එවැනි යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් අවසාන කිරීමට අදාළ වන තාක් දුරට, එම ගිවිසුම යම් ගිවිසුමක්—

(අ) සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් පිහිටුවීමට හෝ විසුරුවා හැරීමට; හෝ

(ආ) එහි සාමාජිකයන්ගේ හෝ හවුල්කරුවන්ගේ සංයුක්තියට හෝ අයිතිවාසිකම්වලට හෝ බැඳීම්වලට

අදාළ වන තාක් දුරට එම ගිවිසුම.

යම් ගිවිසුමක් සුරැකුම්පත් හෝ සුරැකුම්පත්වල යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ඇති කිරීමට අදාළ වන තාක් දුරට එම ගිවිසුම.

දෙවන උපලේඛනය

යුක්තිසහගත භාවයේ පරීක්ෂණය යොදා ගැනීම සඳහා මාර්ගෝපදේශ

විශේෂයෙන් 7 වන වගන්තියේ කාර්ය සඳහා සැලකිල්ල යොමු කළ යුතු කරුණු පහත දැක්වෙන ඒවායින් අදාළ යයි පෙනී යන කරුණු ය :—

(අ) (වෙනත් දේ අතර) ගණුදෙනුකරුගේ අවශ්‍යතා ඉටු කළ හැකිව තිබූ විකල්ප මාර්ග සැලකිල්ලට ගෙන පාර්ශ්වකරුවන්ගේ එකිනෙකට සාපේක්ෂ කේවෙල් කිරීමේ තත්ත්වවල ශක්තිය;

(ආ) නියමයට එකඟවීමට ගණුදෙනුකරුට පෙළඹවීමක් ලැබුණේ ද යන වග හෝ එය භාර ගැනීමේ දී වෙනත් තැනැත්තන් සමග ඊට සමාන ගිවිසුමකට ඇතුළත්වීමේ අවස්ථාවක් එහෙත් සමාන නියමයක් භාර ගැනීමට සිදු නොවී තිබුණේ ද යන වග ;

(ඇ) (වෙනත් දේ අතර වෙළෙඳාමේ යම් සම්ප්‍රදායක් සහ පාර්ශ්වකරුවන් අතර ගනුදෙනු කිරීමේ දී යම් පූර්ව ක්‍රියාවලියක් සැලකිල්ලට ගෙන) නියමයේ පැවැත්ම සහ එහි ප්‍රමාණය ගැන ගනුදෙනු කරු දැන සිටියේ ද නැතහොත් යුක්තිසහගත ලෙස දැන සිටියේ ද යන වග;

(ඈ) යම් කොන්දේසියකට අනුකූලව ක්‍රියාකර නොමැති නම්, අදාළ වගකීම නියමයෙන් බැහැර කෙරෙන හෝ සීමා කෙරෙන අවස්ථාවක, ඒ කොන්දේසියට අනුකූලව කටයුතු කිරීම බලාපොරොත්තුවීම ප්‍රායෝගික ද යන්න ගිවිසුම ඇති කර ගන්නා වේලාවේ දී යුක්තිසහගත වන්නේ ද යන වග;

(ඉ) භාණ්ඩ පාරිභෝගිකයාගේ විශේෂ අණට ගැලපෙන පරිදි සාදනු ලැබුවේ ද, සකස් කරනු ලැබුවේ ද හෝ අනුගත කරන ලද්දේ ද යන වග.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.